ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

ප්‍රාදේශීය කාර්යාලය / பிராந்திய காரியாலயம் / Regional Office

දුරකථනය / தொலைபேசி / Telephone


දිනය / திகதி / Date: 2024.05.03

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | චන්දන ජගත් අමරසිංහ මයා,<br>642, ඇල්හේන පාර,<br>ගොතටුව, අංගොඩ. |
| වගඋත්තර පාර්ශවය | : | 01. එස්.කේ.ඩී.එස්. උදවංශ මයා,<br>ස්ථානාධිපති,<br>පොලිස් ස්ථානය,<br>මුල්ලේරියාව. |
| | | 02. පො.සැ 45827 සිසිර කුමාර මයා,<br>පොලිස් ස්ථානය,<br>මුල්ලේරියාව (වර්තමාන සේවා ස්ථානය - කලවාන) |

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/551/16</u>**

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-**

උක්ත නම් සඳහන් පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, අංගොඩ, මණ්ඩවිල, රුක්ගහවත්ත පදිංචි කේ. නාමල් උදය කුමාර යන අයගේ නිවසට, අංගොඩ, ගොතටුව, කජුගහ වත්ත, අංක 164 හි එල්.පී පෙරේරා මහත්මියට අයිති තාප්පයක් කැඩූ ගල් හා අබලි ද්‍රව්‍ය ට්‍රැක්ටරයක් මගින් 2016.01.12 දින රැගෙන ආ බවත්, එසේ ගෙන ආ ගල් කැබලි දමා යන විට සිවිල් ඇඳුමින් සැරසුනු පොලිස් නිලධාරියෙකුයැයි කියාගත් අයෙක් හා ග්‍රාම ආරක්ෂක භටයෙක්ද තමාව ට්‍රැක්ටරයද සමග අත්අඩගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ගිය බවයි. එහිදී ස්ථානාධිපතිතුමා විසින් තමාට පහරදී තමාව සිරමැදිරියට දමා නැවත කුඩුවෙන් එළියට ගෙන ප්‍රකාශයකට අත්සන් ගෙන නැවත සිරගත කරන ලද බවත්, පසු දින එනම් 2016-01-13 වන දින තමාව ඇප මත නිදහස් කරන ලද අතර, ජනවාරි 14 වන දින තමාව අධිකරණයට ඉදිරිපත් කරන ලද බවත් දක්වා ඇත. එසේම අධිකරණය වෙත ට්‍රැක්ටරය රැගෙන යාමේදී පස් පුරවා ඉදිරිපත් කළ බවත් සඳහන් කර ඇත. මෙලෙස උක්ත වගඋත්තරකරුවන් විසින් සිදු කරන ලද නීති විරෝධි ක්‍රියාව සම්බන්ධයෙන් පරීක්ෂණය කර සහනයක් ලබාදෙන ලෙසට පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04. / இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04. / No.14, R.A. De Mel Mawatha, Colombo-04.
සභාපති / தவிசாளர் / Chaiman: 011-2505551
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

මෙම පැමිණිල්ලට අදාලව සිදුකරන ලද 2016-07-28 දිනැති පරික්ෂණයේදී කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, තමා අසල්වැසියෙකුගේ ඉල්ලීම මත 2016-01-12 වන දින පැය 17.00 ට පමණ ගඩොල් පටවාගෙන ගොස් දමා නැවත පැමිණෙමින් සිටියදී 2016-07-28 දින කොමිෂන් සභාවේ පරික්ෂණයට පෙනී සිටින පො.සැ 45827 සිසිර කුමාර මහතා විසින් තමාව අත්අඩංගුවට ගත් බවයි. අත්අඩංගුවට ගැනීමෙන් පසු පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය වහාම එවකට ස්ථානාධිපතිව සිටි පො.ප දයාවංශ නිලධාරියා විසින් පහරදී සිරමැදිරියට දැමූ බව දක්වා ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු ඉදිරිපත් කිරීම =:**

උක්ත පැමිණිලිකරු ඉදිරිපත් කරනු ලබන පැමිණිල්ල සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් වගඋත්තරකරු සඳහන් කර ඇත්තේ, 2016.01.11 වන දින මුල්ලේරියාව පොලිස්බල ප්‍රදේශයේ මණ්ඩාවිල ග්‍රාම සේවක වසම භාර ග්‍රාම නිලධාරි විසින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් එනම්, IDH රෝහලට අයත් කර්මාන්තපුර ප්‍රදේශයේ අනවසර පදිංචිකරුවන් පදිංචිව සිටින ස්ථානයට අනවසරයෙන් පස් රැගෙනවිත් ගොඩකිරීම සම්බන්ධයෙන් කරනු ලැබූ පැමිණිල්ල විභාග කර ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගත් බවත්, ඔවුන් නැවත ඉඩම ගොඩ නොකරන බවට ප්‍රකාශ කර නික්ම ගිය බවත්ය. නමුත් 2016.01.12 දින ලද තොරතුරකට අනුව නාමල් උදය පෙරේරා යන අය නැවත ට්‍රැක්ටරයක් ආධාරයෙන් ගොඩකිරීම් සිදුකරන බව ප්‍රකාශ වූ අතර, ඒ පිළිබඳව විමර්ශනය කිරීමට පාරිසරික තොරතුරු සටහන් පොතේ පිටුව 88 ජේද 40 යටතේ සටහන් යොදා නිලධාරීන් පිටව ගොස් ඇත. ඒ අනුව මෙම පැමිණිලිකාර චන්දන ජගත් අමරසිංහ යන අයට IDH රෝහලට අයත් ඉඩමෙන් පිටතින් පස් රැගෙන විත් ගොඩකිරීම සම්බන්ධයෙන් රජයේ ඉඩම් අනවසරයෙන් ගොඩකිරීම සම්බන්ධයෙන් වරද කියා දී ආර්.ජී. 0743 දරණ ට්‍රැක්ටරය හා රියදුරු අත්අඩංගුවට ගත් බවද සඳහන් කර ඇත. පසුව සැකකරු 2016.01.14 දින අධිකරණයේ පෙනී සිටිය යුතු බවට උපදෙස් ලබාදී ඇප ලබාදුන් බවත්, 2016.01.14 දින වුදිතට එරෙහිව 1992 අංක 33 දරණ ඛණිජ ද්‍රව්‍ය පනත යටතේ අළුත්කඩේ අංක 04 මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කළ බවත්, අත්අඩංගුවට ගනු ලැබූ සැකකරුට පහරදීමක් සිදු නොකළ බවත් සඳහන් කර ඇත.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීමට අනුව, 2016.01.12 දින අංගොඩ, මණ්ඩවිල, රුක්ගහවත්ත, අංක 128/වී/56 හි පදිංචි උඩුගල ආරච්චිගේ කාන්ති නයනා යන අයගේ ඉල්ලීම මත, ඇයගේ ඉඩමේ වතුර එකතු වන ස්ථානයකට දැමීම සඳහා ගල් කැබලි හා සිමෙන්ති කැබලි තමාට අයත් ට්‍රැක්ටරයෙන් ගෙනවිත් දමා ඇති අතර, එලෙස කඩා ඉවත් කළ ගල් හා සිමෙන්ති කැබලි ගෙනවිත් දමා ට්‍රැක්ටරය මීටර් 200ක් පමණ දුර ගිය විට පොලිස් නිලධාරියෙකු විසින් ඒ පිළිබඳව ප්‍රශ්න කළ බවත්, පසුව ඉඩමේ අයිතිකාරිය වන කාන්ති නයනා යන අය ඇයගේ සැමියා සමග එම ස්ථානයට ගොස් ගල් හා සිමෙන්ති කැබලි ගෙනවිත් දැමූ බව පැවසුව ද නිලධාරියා එය ස්ථානාධිපතිට පවසන ලෙසට ප්‍රකාශ කළ බැවින් එම අයද පොලිස් ස්ථානය වෙත ගොස් ස්ථානාධිපතිට එය එලෙසම පැවසූ බවත් සඳහන් වේ.

තවද පොලිස් ස්ථානය තුළ ට්‍රැක්ටර් රථය ගෙන ගොස් දමා තිබියදී එය ඡායාරූප ගතකර ඇති අතර, එම ඡායාරූප අනුව ට්‍රැක්ටර් රථයේ පස් නොමැති බව නිරීක්ෂණය වන අතර, එහි අංක තහඩු නිරීක්ෂණය නොවේ. එහෙත් එම ට්‍රැක්ටරය නඩු භාණ්ඩයක් ලෙස 2016.01.14 දින අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමේදී පස් හෝ මඩ වැනි යමක් ට්‍රැක්ටරයට පුරවා ඇති බව ජයාරූප වලින් පැහැදිලි වුවද එය කුමන අවස්ථාවේදී ලබාගන්නා ලද ඡායාරූපයක්ද යන්න තහවුරු නොවන බැවින් එකී ඡායාරූපය මගින්, මෙම ට්‍රැක්ටරය අධිකරණයට ඉදිරිපත් කිරීමේදී පස් පුරවා ඉදිරිපත් කළ බවට වන චෝදනාව සම්බන්ධයෙන් නිගමනයකට පැමිණීම අසීරුය.

මෙහිදී පැමිණිලිකරුගේ 2016-01-27 දිනැති මුල් පැමිණිල්ලේ කරුණු දැක්වීම වී ඇත්තේ, කේ. නාමල් උදයකුමාර යන අයගේ නිවසට, අංගොඩ ගොතටුව එල්.සී පෙරේරා මහත්මියට අයත් තාප්පයක් කැඩූ ගල් තමා විසින් තමාට අයත් ට්‍රැක්ටරයෙන් රැගෙන ආ බවත්, එසේ ගෙන ආ ගල් කැබලි දමා නැවත යන විට තමාව අත්අඩංගුවට ගෙන පස් ගෙන ආ බවට චෝදනා ඉදිරිපත් කරමින් පහරදී ජනවාරි 14 දින අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, ඉන්පසුව ඇප මත නිදහස් වූ බවත්ය. ජනවාරි 18 දින පොලිසියට ගොස් ට්‍රැක්ටරය බැලීමේදී එහි ට්‍රේලරයට පස් පුරවා තිබෙනු දුටු බවද දක්වා ඇත. තවද පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති 2018-07-26 දිනැති ලිපියට අනුව දක්වා ඇත්තේ, කිසිදු හේතු දැක්වීමකින් තොරව තමාව හා ට්‍රැක්ටර්ට්‍රේලරය පොලිස් ස්ථානයට රැගෙන ගොස් පහරදී බලපත්‍රයක් රහිතව පස් කියුබ් එකක් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් කරන ලදමුත් පොලිස් උධෘතයන්හි සටහන් කරන ලද්දේ, රජයේ ඉඩමක් පිටතින් පස් ගෙනවිත් ගොඩකිරීම සම්බන්ධයෙන් වන බවයි. පැමිණිලිකරු 2016-07-28 දින මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදීද කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා විසින් පදවාගෙන එනු ලැබුවේ හිස් ට්‍රැක්ටරය වන අතර, තමා විසින් රැගෙන එනු ලැබුවේ ගල් කැබලි වන බවත්, පස් ප්‍රවාහනය කිරීමක් සිදු නොකළ බවත්ය.

පැමිණිල්ලේ කරුණු සම්බන්ධයෙන් අදාල ඉඩමේ පදිංචිකරුවන් වන උඩුවිල ආරච්චි කාන්ති නයනා යන අය දිවුරුම් ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ, තම ඉඩමේ වතුර රැඳෙන ස්ථානයක් ගොඩකරන ලෙසට ඩෙංගු මර්ධන ඒකකය මගින් දැනුම්දීම හේතුවෙන් ගොඩනැගිලි කඩා ඉවත් කරන ලද කැබලි ගෙනවිත් දෙන ලෙස මෙම පැමිණිලිකාර චන්ද්‍ර ජගත් අමරසිංහ යන අයට දන්වන ලද බවත්, ඒ අනුව එම අය විසින් ගල්/සිමෙන්ති කැබලි ගෙනවිත් දමා නැවත යන විට පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇති බවත්ය. තවද තමා සහ තම ස්වාමියා පොලිස් ස්ථානයෙන් කරන ලද දැනුම්දීමට අනුව පොලිස් ස්ථානය වෙත ගිය අවස්ථාවේදී ස්ථානාධිපතිතුමා විසින් මෙම පැමිණිලිකරුගේ හිසට පහරදුන් බවද දක්වා ඇත.

එසේම මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසු නඩු අංක 45576/16 යටතේ නඩු පවරා ඇති අතර, එහිදී වගඋත්තර පාර්ශවීය (අධිකරණයේ සාක්ෂිකරු) පො.සැ 45827 විසින් සාක්ෂි ලබා දෙමින් මෙම පැමිණිලිකරු 2016.01.11 වන දින මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා ලද බවට සඳහන් කර ඇතත්, සිවිල් ආරක්ෂක සහයක 77714 සංජීව යන අය විසින් අධිකරණය හමුවේ සාක්ෂි ලබා දෙමින් 2016.01.12

එන දින අදාළ අත්අඩංගුවට ගැනීම සිදුකරන ලද බවට පරස්පර කරුණු දැක්වීමක් සිදුකර ඇති බව අදාළ නඩු වාර්තා නිරීක්ෂණය කිරීමේදී පෙනී යයි.

තවද, වගඋත්තරකරුවන් විසින් විත්තිකරු (පැමිණිලිකරු) අත්අඩංගුවට ගෙන ඇත්තේ, රජයේ ඉඩමක් ගොඩකිරීම සම්බන්ධයෙන් වන වරදකට වන නමුත් විත්තිකරුට විරුද්ධව පොලීසිය නගා ඇති චෝදනාව වන්නේ බලපත්‍රයක් නොමැතිව පස් කියුබ් එකක් ට්‍රැක්ටර් රථයකින් ප්‍රවාහනය කිරීම වන බවත්, අනවසර ගොඩකිරීමක් හා බලපත්‍රයක් නොමැතිව පස් ප්‍රවාහනය කිරීමක් යනු සිද්ධිමය වශයෙන් ගත් කළ අවස්ථා දෙකක් වන බවටද නමුත් විත්තිකරුට (පැමිණිලිකරු) විරුද්ධව රජයේ ඉඩමක් අනවසරයෙන් ගොඩ කිරීමක් සම්බන්ධයෙන් චෝදනාවක් ඉදිරිපත් කර නොමැති බවද අධිකරණයේද අවධානයට ලක් වී ඇත.

මෙකී පැමිණිල්ලට අදාළ අධිකරණ තීරණය අනුව නිරීක්ෂණය වන්නේ පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ IDH උණ රෝහලට අයත් ඉඩමක් අනවසරයෙන් ගොඩ කරන බවට ලැබී ඇති තොරතුරක් මත වුවද පැමිණිලිකරුට විරුද්ධව ඉදිරිපත් කර ඇති චෝදනාව වන්නේ බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් පස් ප්‍රවාහනය කිරීමක් සම්බන්ධවයි. අධිකරණය හමුවේ මෙම කරුණු දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න වලට භාජනය වෙමින් විභාග වී ඇති අතර පැමිණිලිකරු අනවසරයෙන් රජයේ ඉඩමක පස් විකුණු බවට සාධාරණ සැකයෙන් තොරව අධිකරණය ඉදිරියේ ඔප්පු වී නොමැත. අත්අඩංගුවට ගන්නා ලද කාරණාව අදාළ නොවන වෙනත් කරුණක් වන බලපත්‍ර නොමැතිව පස් ප්‍රවාහනය කළබවට චෝදනා ගොනු කිරීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය වන අතර, ගරු අධිකරණය විසින් පැමිණිලිකරු එකී චෝදනාවෙන් නිදොස් කොට නිදහස් කර ඇත.

තවද වගඋත්තරකරු කියා සිටින පරිදි රජයේ ඉඩමක් ගොඩ කිරීමක් සිදු කළේ නම් එම ඉඩම ගොඩ කිරීමට ආධාර අනුබල දුන් එම ඉඩමේ වත්මන් පදිංචිකරුවන් අත්අඩංගුවට නොගැනීම බරපතල ගැටළුවකි. කෙසේ වෙතත්, අධිකරණය විසින් මෙම සියළු කරුණු සලකා බලා ඇති අතර, ඒ අනුව විත්තිකරු සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කර ඇත.

මෙම කරුණු අනුව, රජයට අයත් ඉඩමක් අනවසරයෙන් ගොඩ කරන බවට ලැබී ඇති තොරතුරක් මත පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇතත්, පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත් කිරීමේදී, පැමිණිලිකරුට විරුද්ධව බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් පස් ප්‍රවාහනය කිරීමක් සම්බන්ධව චෝදනා ඉදිරිපත් කරමින් අධිකරණයට කරුණු වාර්තා කර ඇති බව අනාවරණය වේ.

නිගමනය =:

පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ කියා සිටින පරිදි උක්ත වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.

01. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී ඇති බැවින්, අදාළ වගඋත්තරකරු සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතුය.

02. වගඋත්තරකාර පාර්ශවය වන පළමුවන හා දෙවන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමෙන් පැමිණිලිකරුට සිදුව ඇති අගතිය සම්බන්ධයෙන් පැමිණිලිකරු වෙත රු.40,000/- (රුපියල් හතලිස් දහස) ක මුදලක් ගෙවිය යුතුය.

2024. ०६ . 12 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය.
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික).
සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

එල්.ටී.බී. දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. අමාත්‍යතුමා.
මහජන ආරක්ෂ අමාත්‍යාංශය.
14 වන මහල. සුහුරුපාය. බත්තරමුල්ල.

02. පොලිස්පති.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

03. අධ්‍යක්ෂ, - අදාළ නිලධාරීන් වෙත නිර්දේශය යොමු කිරීමට
පොලිස් මානව හිමිකම් කොට්ඨාශය.
අංක – 07, 7 වන මහල. කොටා ටෙරස්.
එන්.එම් පෙරේරා මාවත. කොළඹ 08.

B/